www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පුටින් ටෙහෙරානයේ : එක්සත් ජනපද-රුසියා ගැටුම පුලුල් වේ

**Putin in Tehran: US-Russia rift widens**

**පීටර් සිමන්ඩ්ස් විසිනි**

**2007 ඔක්තෝබර් 18**

මේ සතියේ රුසියානු ජනාධිපති ව්ලඩිමීර් පුටින්ගේ ටෙහෙරාන් ගමන, විශේෂිතවම ඉරානයේ න්‍යෂ්ඨික වැඩසටහනට විරුද්ධව බුෂ් පරිපාලනයේ යුධ තර්ජනය වැනි කරුනු ගනනාවක් සම්බන්ධව මොස්කව් සහ වොෂින්ටනය අතර ගැඹුරුවන ආගාධය සනිටුහන් කරයි.

1943 ටෙහෙරානයේදී චර්චිල් හා රූස්වෙල්ට් සමග ස්ටාලින්ගේ යුධකාලීන සම්මන්ත්‍රනයෙන් පසුව රුසියානු හෝ සෝවියට් නායකයෙකු පලමුවරට ඉරානයට කල සංචාරය අතහැර දැමීමට යෙදවුන එ.ජ. පීඩනය පුටින් ප්‍රතික්ෂේප කලේය. ඉරානය තවදුරටත් හුදකලා කිරීමේ අරමුන සහිතව දැඩි සම්බාධක පනවන තුන්වන යෝජනාව සම්මත කරගැන්මට එ.ජා. ආරක්ෂක කවුන්සිලය මත පීඩනය යොදවන බුෂ් පරිපාලනයට එල්ලකල රාජ්‍යත්‍රාන්තික කම්මුල් පහරක් ලෙස මෙම තීරනය සලකනු ලැබේ.

රුසියාව, ඉරානය, අසර්බයිජානය, තුර්ක්මෙනිස්තානය, සහ කසාක්ස්තානය වන කැස්පියන් රාජ්‍ය පහේ රැස්වීමට සහභාගිවීම පුටින්ගේ ටෙහෙරාන ගමනේ නාමමාත්‍රික අවශ්‍යතාවයයි. කෙසේවුවද, ඉරානයට එරෙහි මිලිටරි ප්‍රචන්ඩත්වයට විරුද්ධවීමට රුසියානු ජනාධිපති මෙම වේදිකාව පාවිච්චි කලේය. "අපි බලය පාවිච්චිය පමනක් නොව ශක්‍යතාවයක් ලෙස බලය ගැන සඳහන් කිරීමද ප්‍රතික්ෂේප කලයුතු වෙමු. මෙය ඉතා වැදගත් වේ. කැස්පියන් රටවලින් එකකට හෝ එරෙහිව ප්‍රචන්ඩත්වය හෝ වෙනත් ආකාරයක මිලිටරි ක්‍රියාමාර්ගයක් ගැන අප තවත් රාජ්‍යයන්ට යටත් නොවිය යුතුය"යි ඔහු පැවසීය.

පුටින් විසින් "විකල්පයක් ලෙස බලය ගැන සඳහන් කිරීම" ප්‍රතික්ෂේප කරනු ලැබුවේ, ඉරානය සම්බන්ධව මිලිටරි බලයද ඇතුලත්ව "සියලු විකල්ප මේසය මත ඇත"- නම්වූ එ.ජ. ජනාධිපති බුෂ්ගේ ඉරානය පිලිබද යලි යලිත් කෙරුනු අනතුරු ඇගවීම් වලට සම්බන්ධවය. චෙච්නියාවේ තම රජය ගෙනයන කෲර යුද්ධය තිබියදී, සාමයේ මිනිසෙක් ලෙස පෙනීසිටීමේ පුටින්ගේ උත්සාහය, තමන් ඉරානයට තර්ජනය නොකරන බවට කරනු ලබන බුෂ්ගේ ප්‍රකාශයන්ට වඩා වැඩි විශ්වාසනීය බවක් අත් කර ගත නොහේ. මේ සියලු වාග් ප්‍රලාප පිටුපස ඇත්තේ මධ්‍යම ආසියාවේ සහ මැද පෙරදිග ඇමරිකානු හා රුසියානු ධනවාදයේ ආර්ථික සහ උපායමාර්ගික අවශ්‍යතාවල ගැටුමයි.

"කැස්පියන් මුහුදුබඩ රාජ්‍යවලට එරෙහිව හමුදා ප්‍රහාරයක් සඳහා ඔවුන්ගේ භූමි පාවිච්චි කිරීමට කිසිඳු රටකට සාමාජික රාජ්‍ය ඉඩනොදෙන බවට" පොරොන්දු ප්‍රකාශයක් පුටින්ගේ පෙලඹවීම මත, ටෙහෙරාන් සමුලුව සම්මත කලාය. ඉරානයට තර්ජනය කිරීම පමනක් නොව, විශේෂිතවම අසර්බයිජානය ඇතුලු මධ්‍යම ආසියානු රටවල් ගනනාවක් සමග හමුදා සම්බන්ධකම් ඇතිකරගෙන සිටින එ.ජ.ය අවහිර කිරීම මෙහි පැහැදිලි අරමුන විය. නැටෝ රැකවරන මත අසර්බයිජාන් හමුදා සන්නද්ධ කිරීමට හා පුහුනු කිරීමටත් පැරනි සෝවියට් ගුවන් කඳවුර නවීකරනය සහ කැස්පියන් මුහුදේ අසර් නාවික පෙනීසිටීම් සඳහාත් එ.ජ. උපකාර කර තිබේ. අසර් ආන්ඩුව විසින් මුලදී ප්‍රතික්ෂේප කරනු ලැබූ භූමිකාව වන ඉරානයට එරෙහිව එ.ජ. යුධ සැලසුම් වලට සහාය වීමට, අසර්බයිජානයට පීඩනය දැමීම, සදහා යැයි සැක කල හැකි අයුරින් සැප්. 28 දා සීඅයිඒ අධ්‍යක්ෂක ජනරාල් මයිකල් හේඩන් සංචාරයක් සඳහා අප්‍රසිද්ධවම බාකු වෙත ගියේය.

මේ තත්වය තුල මෑතකදී නිදහස ලබාගත් අසර්බයිජානය වැනි කුඩාම රාජ්‍ය සියුම් බලතුලන ක්‍රියාවල යොදවා ඇත. සෝවියට් සංගමය බිඳවැටීමේ පටන්, උත්සන්න වන ප්‍රධාන බල තරගයක සංග්‍රාම භූමියක් බවට මධ්‍යම ආසියාව පත්ව තිබේ. ප්‍රධාන තෙල් නිපදවන්නෙක් වන කුවේටයේ තිබෙන ප්‍රමානයෙන් අඩක්, එනම් බැරල් බිලියන 49 ක තෙල් නිධිද ගෑස් ඝන අඩි ට්‍රිලියන 230 ක්ද කැස්පියන් මුහුදේ පමනක් ඇති බවට ගනන් බලා ඇත. පවතින රුසියානු නලමාර්ග ජාලය නොතකා සහ මධ්‍යම ආසියාවේ රුසියානු බලපෑම පහතහෙලන අයුරින්, කැස්පියන් මුහුද හරහා අසර්බයිජානයට නලමාර්ගයක් ඉදිකරන එ.ජ. සැලැසුම් දුෂ්කර තත්වයකට පත්කරන්නට ටෙහෙරාන් සමුලුව යොදාගන්නට පුටින් උත්සාහ ගත්තේය.

ඉරානයට තම න්‍යෂ්ඨික වැඩසටහන "සාමකාමී ආකාරයෙන් සාක්‍ෂාත් කරගන්නට උදව්කරන්නේ රුසියාව පමනකි" යැයි ප්‍රකාශකරමින්, පුටින් ඉරාන න්‍යෂ්ඨික වැඩසටහනට ඉතා පැහැදිලිවම සහයෝගය පල කලේය. "සාමකාමී අරමුනු සඳහා න්‍යෂ්ඨික බලශක්තිය නිෂ්පාදනයට සහ උපයෝජනයට ඉරාකයද ඇතුලත් න්‍යෂ්ඨික අවි සීමාකිරීමේ ගිවිසුමේ (Nuclear Non-Proliferation Treaty - NPT) අත්සන්කරුවන්හට අයිතියක් ඇති බව" කැස්පියන් රාජ්‍ය සමුලුව නැවත නහවුරු කලාය. තමන් න්‍යෂ්ඨික අවි නිෂ්පාදනය කරන්නට සැලසුම් කරන බවට කෙරෙන එ.ජ. චෝදනා ප්‍රතික්ෂේප කරන ඉරානය, එන්.පී.ටී. (NPT) යට අනුව තමන්ට යුරේනියම් වර්ධනය කිරීමේ කර්මාන්ත ශාලාවක් තැනීමට ඇති අයිතිය ස්ථිර කලේය.

රුසියානු සමාගම් විසින් තැනෙන න්‍යෂ්ඨික බලශක්ති ප්‍රතික්‍රියාකාරකය නිමවන දිනය ප්‍රකාශයට පත් කිරීම පුටින් අතරමගදී නතර කලේය. ගෙවීම් මත ඇතිවූ ආරවුලක් පාවිච්චි කරමින් ව්‍යාපෘතිය කල් යවන්නට මොස්කෝව මුලදී උත්සාහ කල අතර එ.ජා. යෝජනාවලට එකගවන ලෙසට ඉරානයට පීඩනය යෙදීය. මෙම ලීවරය අත්නොහරින අතරේ, කලාපයේ වැදගත් රුසියානු වුවමනාවන් එ.ජ.ට පාගාදමන්නට මොස්කෝව ඉඩ නොතබන බව වොෂින්ටනයට දන්වන්නට පුටින් තම ටෙහෙරාන් සංචාරය උපයෝගී කරගත්තේය. එ.ජ මාධ්‍යවල බොහෝ විට් පතුරුගැසෙන ඉරාන ජනාධිපති මහමූද් අහ්මදිජෙනාඩ්ව, ඉතා ප්‍රසිද්ධියේ මුනගැසුනු ඔහු පෙරලා මොස්කව් සංචාරයක් සඳහා ඔහුට ආරාධනා කලේය.

## මහා බල තරගය

පසුගිය සතිය පුරා එ.ජ. ඉහලපෙලේ නිලධාරීන් සහ යුරෝපීය නායකයින් සමග පුටින්ගේ රුස්වීම්, වොෂින්ටනය සහ මොස්කෝව අතර වැඩෙන ආගාධය විවෘතවම ප්‍රදර්ශනය කිරීමක් විය. ඉරානයට එරෙහි එ.ජ. සම්බාධකවල අලුත් වටයකට සහයෝගය ලබාගන්නට පුටින්ව ඒත්තුගැන්වීමට සහ නිදහස් රාජ්‍යයක් ලෙස කොසෝවෝ ස්ථාපිතකිරීම සඳහා එ.ජ. හා යුරෝපීය සහාය ලබන යෝජනාවලට ඇති රුසියානු විරුද්ධත්වය අවසන් කරගන්නට උත්සාහ කිරීමට ප්‍රංශ ජනාධිපති නිකලස් සාර්කෝසි ගිය සතියේ මොස්කව් බලා ගියේය. බෝල්කනයේ වැඩෙන බටහිර බලපෑම්වලට දිගින් දිගටම විරුද්ධවන මොස්කෝව, කොසෝවෝව සර්බියාවේ පලාතක් ලෙස තිබිය යුතුබව ස්ථිර කරමින් තම සම්ප්‍රදායික මිතුරු සර්බියාවට සහයෝගය දෙන ලදී.

සාර්කෝසිගේ උත්සාහය කාරනා දෙකෙහිදීම අසමත් වුනේය. සබඳතාවයන්ගේ පලුදු වීම ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කෙරුනු ඔක්. 10 දා ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාවේදී පුටින් මෙසේ ප්‍රකාශ කලේය. "ඉරානය න්‍යෂ්ඨික ආයුධ පසුපස යන බව ඔප්පු කරන්නට අපට වාස්තවික සාක්ෂි නොමැති බැවින් ඔවුන්ට එබඳු සැලසුම් නැති බව අපට විශ්වාස කරන්නට සිදුව තිබේ." ඉරාන ආයුධ වැඩසටහන ගැන අන්තර්ජාතික පරමානු බලශක්ති අධිකාරියේ (අ.ප.බ.අ.) පරීක්ෂකවරුන්ට ස්ථිරවම කිසිඳු සාක්ෂියක් හමු නොවූබව රුසියානු ජනාධිපති පැහැදිලිවම කියා සිටියේය.

නමුත්, එම ප්‍රකාශය කිරීමෙන්, පුටින් ඉරානයට එරෙහිව එ.ජා. සම්භාධක පැනවීම යුක්තියුක්ත කරන්නට පාවිච්චි කල බුෂ් පරිපාලනයේ තහවුරු නොකල චෝදනාවන්ට පහර එල්ල කලේය. ඉරානය න්‍යෂ්ඨික අවි නිපදවන්නට සැරසෙනවාද නැද්ද යන්න තවමත් නොපැහැදිලිය. නමුත් 2003හිදී එ.ජ. මූලිකත්වය ගත් සාපරාධී ඉරාක ආක්‍රමනය යුක්තියුක්ත කරන්නට නොපැවතුනු සමූහ ඝාතක අවි යොදාගත් ලෙසටම ධවල මන්දිරය ඉරානය සමග ගැටුම උත්සන්න කිරීම සඳහා ව්‍යාජ ලෙස මෙම කාරනාව යොදා ගනී.

පුටින්ගේ ප්‍රකාශය නිසා මතුවුන පැහැදිලි මතභේදයන් සගවන්නට දැරූ උත්සාහයේදී සාර්කෝසි ආකුල ලෙස ගොතගසන්නට විය. සාර්කෝසි සහ ඔහුගේ විදේශ ඇමති බර්නාඩ් කුච්නර් යන දෙදෙනාම ඉරාන අවි වැඩසටහන ඉතා ඉහල මට්ටමක පවතින බවත් මිලිටරි ක්‍රියාමාර්ගයකින් ඉරානයට තර්ජනය කරන්නට තමන් වොෂින්ටනය සමග අත්වැල් බැඳගත් බවත් ස්ථිර කලෝය. "මම එක්සත් ජනපදයේ මිතුරෙක්. මිතුරෙක් කියන තේරුම ගැත්තෙක් නොවේ." යනුවෙන් බවුමන් රාජ්‍ය තාක්‍ෂනික විශ්ව විද්‍යාලයේදී රුසියානු ප්‍රේක්ෂකාගාරයට පවසමින් මොස්කව්හිදී සාර්කෝසි ආරක්‍ෂාකාරී විය.

පුටින්ගේ ප්‍රකාශයට ප්‍රතිචාර දක්වමින්, ඔක්. 11 දා, එ.ජ. රාජ්‍ය ලේකම් කොන්ඩොලීසා රයිස් මෙසේ පැවසීය. "ඉරාන ඉතිහාසයේ අඳුරුකිරීම් පැවතුනා හා ඇත්තටම අ.ප.බ.අ.ට බොරුකර තිබුනා. ඉරානය න්‍යෂ්ඨික අවි තනන්නාවූ ද්‍රව්‍ය කරා යන න්‍යෂ්ඨික තාක්‍ෂන පසුපස ඇදෙනවා." න්‍යෂ්ඨික අවි දක්වා යන තාක්‍ෂනය හා සත්‍ය අවි නිෂ්පාදන වැඩසටහන් අතර ඇති වෙනස රයිස් සිතාමතාම අඳුරු කලාය. නටාන්ස්හි පිහිටි ඉරාන යුරේනියම් වර්ධනය කිරීමේ කම්හල බල ප්‍රතික්‍රියාකාරකය සඳහා ඉන්ධන නිෂ්පාදනයෙන් බෝම්බ සඳහා විබන්ධ ද්‍රව්‍ය සාදන්නට වෙනස්කල හැකි බව සත්‍යයකි. කෙසේවුවද, යුරේනියම් වර්ධනයට එන්.පී.ටී.ය යටතේ අවසර ඇති අතර න්‍යෂ්ඨික අවි නොමැති රටවල් ගනනාවක් විසින් පවත්වාගෙන යන දෙයකි.

තවත් විවාදශීලී කාරනාවක් වන නැගෙනහිර යුරෝපයේ මිසයිල නාශක කඳවුරු ගොඩනැගීම සඳහා වන එ.ජ. සැලසුම් ගැන සාකච්ඡා කරන්නට එ.ජ. ආරක්‍ෂක ලේකම් රොබට් ගේට්ස් සමග මොස්කව් කරා ගුවනින් යන අතරතුරදී රයිස් මෙම ප්‍රකාශය කලාය. එ.ජ. අන්තර් ප්‍රතිග්‍රාහක මිසයිල 10 ක් පෝලන්තයේ

රැඳවීමට සහ 2010 දී චෙක් සමූහාන්ඩුවේ ඉලක්කගත රේඩාර් යන්ත්‍රයක් සවිකිරීමට ඇති යෝජනාවලට රුසියාව නුරුස්නා සහගත ලෙස විරුද්ධය. ඉරානය වැනි "මදාවි රාජ්‍ය" වලින් එන මිසයිල වලට විරුද්ධවන්නට මිසයිල නාශක පද්ධතියක් අවශ්‍ය බවට වන තර්ක මොස්කව් ප්‍රතික්ෂේප කර ඇති අතර, ඒ වෙනුවට එ.ජ. රුසියාවේ යුධමය හැකියාව පහතලා සලකන්නට උත්සාහ කරන බව ස්ථිර කලේය.

පසුගිය සිකුරාදා පුටින්ගේ ඩචා නිකේතනයේදී කෙරුනු කතා එක් අවස්තාවකදී"ද්වේශසහගත" ලෙසට විස්තර කෙරිනි. තමා එන තෙක් රයිස් සහ ගේට්ස් විනාඩි 45ක් පොරොත්තුව තැබීමෙන් පසු මෙසේ ප්‍රකාශකරමින් පුටින් රැස්වීමට පූර්විකාව සැපයීය. " එවැනි සංකීර්න හා විවිධහැඩගත් කතා කෙරෙන අතරතුරේ නැගෙනහිර යුරෝපීය රටවල් සමග ඔබේ සම්බන්ධතා බලහත්කාරී නොවනු ඇති බවට අපි බලාපොරොත්තු වෙමු." රුසියාව ව්‍යාපෘතියට මතුපිටින් ඈඳ ගන්නට එ.ජ. නිලධාරීන් යෝජනා කල නමුදු මිසයිල නාශක පද්ධතිය නතරකිරීම සඳහා මොස්කව්හි ඉල්ලීම් සහමුලින්ම ප්‍රතික්ෂේප කලෝය.

ඇමරිකානු මිසයිලනාශක සැලසුම්වලට ප්‍රතිචාර වශයෙන් 1992 හිදී නතරකර දැමුනු එහි උපක්‍රමික ටීයූ-95 "බෙයාර්" බෝම්බ හෙලන ගුවන්යානා තුලින් රුසියාව ගෝලීය ගුවන්ගමන් නැවත ආරම්භ කලේය. යුරෝපීය භූමිතුල රඳවා තබාගත හැකි හමුදා ගනන, යුධ ටැංකි, යුධ ගුවන්යානා, සහ වෙනත් මිලිටරි උපකරන සීමාකරන සීතල යුධ සමයේ ගිවිසුමක් වන යුරෝපය තුල සම්ප්‍රදායික හමුදා රැදවීමේ ගිවිසුමට තම සහභාගිත්වය දෙසැම්බර් 12 දින සිට අත්හිටවන බවද පුටින් නිවේදනය කලේය.

ප්‍රථමයෙන් සාර්කෝසි සමගත්, පසුව රයිස් හා ගේට්ස් සමගත් ගැටුනු පුටින් වෙයිස්බඩෙන්හිදී ජර්මන් චාන්ස්ලර් ඇන්ජලා මර්කෙල් සමග සාකච්ඡා සඳහා ගිය සති අන්තයේදී ජර්මනිය බලා පිටත් විය. සඳුදා පැවැත්වූ සාමූහික මාධ්‍ය සාකච්ඡාවේදී නායකයෝ දෙපල පැහැදිලිවම අන්ත දෙකක සිටියෝය. ඉරානය "තැතිගන්වන" අන්තර්ජාතික බලපෑම් නොසැලකිලිමක් ලෙස විවේචනය කල පුටින් ටෙහෙරානය එවැනි පීඩනයකට ප්‍රතිචාර නොදක්වනු ඇතැයි අනතුරු ඇඟවීය. "මාව විශ්වාස කරන්න. ඔවුන්ව බියගැන්විය නොහැකියැ"යි ඔහු ප්‍රකාශ කලේය. ඉරානය තම න්‍යෂ්ඨික ක්‍රියාකාරකම් නොනවත්වුවහොත් නව සම්භාධක වටයක් අවශ්‍ය බව ප්‍රකාශ කරමින් මර්කල් ප්‍රතිචාර දැක්වූවාය.

පලමු වන ලෝක යුද්ධයට පෙරාතුව විසිවන ශතවර්ෂයේ ආරම්බක මහා බල තරගයට භයානක සමානතාවයක් ගිය සතියේ දේශපාලන වැඩ කටයුතු වල පැවතිනි. ආර්ථික සම්පත්, මූලෝපායික බලපෑම් සහිත ක්ෂෙත්‍රයන් සහ යටත්විජිත රාජධානින් පිලිබඳ ගැටුම් වඩ වඩා උග්‍ර වූ අතර අනම්‍ය වීය. පෘථිවි ගෝලයේ මූලික කලාපයන්හි පැවති තරගකාරී වුවමනාවන් සංකීර්න රාජතාන්ත්‍රික උපාමාරු වලට හා සන්ධානගතවීම් වලට තුඩු දුන්නේය. අවසානයේදී, මිලිටරි කඳවුරු දෙකක් ස්ථාපිත වී බෝල්කනය පාදක කොට දශ ලක්ෂ ගනනාවක් මරුමුවට පත් කරමින් මෙලේච්ඡ යුද්ධයක නිරත වූහ.

ඇත්ත වශයෙන්ම රුසියාව හා එ.ජ. අතර ආතතිය වැඩි දියුනු වීමට හැකියාව පවතී. අතීතයේදී ඔහු ඔප්පු කර ඇති ලෙසට නිදසුනක් ලෙස යුරෝපයේ එ.ජ. මිසයිල නාශක සැලසුම් අත් හිටුවීම වෙනුවෙන් ඉරානය බිල්ලට දී බුෂ් පරිපාලනය සමග ගනුදෙනුවකට යාමට පුටින්ට ඉතා හොඳ හැකියාවක් ඇත. නමුත් ධවල මන්දිරය කාරනා දෙකම සම්බන්ධව කිසිදු සම්මුතියකට ඉඩ කඩ නොපෙන්වන අතර ඉරානයට එරෙහිව එ.ජ. මිලිටරි සූදානම් ගැන වැඩෙන සාක්ෂි සමග පුලුල් විනාශයක වැඩීම පිලිබඳ අනතුරු ඇගවේ. සියලු ප්‍රධාන බලයන් තමන්ගේ හිමිකම් වෙනුවෙන් ලංසු තබන සම්පත් සපිරි මැද පෙරදිග හා මධ්‍යම ආසියානු කලාප, 21 වන ශත වර්ෂයේ බෝල්කනය මෙන් මතුවෙමින් සිටී.

ජනාධිපති බුෂ්ටම ගැලපෙන අතාර්කික ආකාරයකින් ඔහු ලොව පුරා ආන්ඩුවල ඉහල කොටස් සමග පූර්වාවශ්‍යතාවයන් පිලිබදව පුද්ගලිකව සාකජ්චා කලේය.

ඉරාන න්‍යාෂ්ඨික අර්බුදය විසඳා ගැනීමට නවතාවයකින් යුතු රාජ්‍ය නායක උත්සාහයන් පුටින් විසින් ඉදිරිපත් කරනු ලැබ පැය ගනනකට පසුව ඇමරිකානු ජනාධිපති එ.ජ.-රුසියානු භේදය ගැන ඇගවීම් නිෂ්ප්‍රභා කල අතර ඉරානය ඊශ්‍රායලය "විනාශ කිරීමට" අදහස් කරගෙන සිටින බවට චෝදනා යලිත් ප්‍රකාශයට පත් කලේය. "තුන්වන ලෝක යුද්ධයක් වැලැක්වීමට ඔබට අවශ්‍යව ඇත්නම්" ඉරාන න්‍යෂ්ඨික වැඩ පිලිවෙල නතර කල යුතු බවද ඔහු ඊට එකතු කලේය.

ඇත්ත වශයෙන්ම එ.ජ. හා රුසියාව හෝ චීනය වැනි වෙනත් රටක් අතර භේදයක් නොතිබුනා නම්, එහි අර්තයෙන්ම, ප්‍රධාන බලවේග සම්බන්ධ කෙරෙන ලෝක යුද්ධයක් ගැන කාරනාවක් බුෂ් ඉස්මතු කරන්නේ ඇයි? සත්‍ය ලෙසටම ලෝක ධනවාදයේ ගැඹුරු කෙරෙන අර්බුදය මගින් පැන නංවන අමු ද්‍රව්‍ය, වෙලඳ පලවල්, හා ලාභ ශ්‍රමය සඳහා භූගෝලීය තරගකාරිත්වය උත්සන්න වීම තවත් ලෝක යුද්ධයකට පාර කපනු ඇත.

මෙම සන්දර්භයේදී, එහි දිගු කාලීන ආර්ථික කඩා වැටීම ආපසු හැරවීමට සිය ගොඩ ගසාගත් මිලිටරි බලය ප්‍රචන්ඩකාරී ලෙස ඇෆ්ගනිස්තානයේ, ඉරාකයේ හා විය හැකි ලෙස ඉරානයේද යොදා ගැනීම හරහා එ.ජ. අධිරාජ්‍යවාදය අතිශයින්ම අස්ථාවර කාර්යභාරයක් ඉටු කරමින් සිටියි.

© www.wsws.org